**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 10 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූලි 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයාට යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් , මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,579,353 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 390,127 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 353,384 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 |
| (i) වරිපනම් හා බදු | 167 | 2 | - |
| (ii) බදු කුලී | 480 | 1,250 | 10 |
| (iii) බලපත්‍ර ගාස්තු | 474 | 506 | - |
| (iv) වෙනත් ආදායම් | 7,442 | 6,718 | 276 |

### 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2009 අගෝස්තු 20 දිනැති ලිපිය ප්‍රකාර සභාව විසින් රැස්කරනු ලබන ආදායම් ප්‍රභවයන් මත ජාතිය ගොඩනැගීමේ බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ) සභාවේ ඉතිරිකිරීම් ගිණුමක 2008 වසරේ සිට මුදල් ආපසු ගැනීමක් සිදු නොකොට 2011 දෙසැම්බර් 31 දිනට රු. 1,085,150 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර එම මුදල වැඩි පොළී ආදායමක් ලබාගැනීම සඳහා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සභාව විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර් සැලැස්මක් සකස්කර නොතිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය.

මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2011 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබාදී ඇති යෝජනා 44 කින් 2011 නොවැම්බර් 21 දිනට වැඩ අවසන් කර තිබුණේ යෝජනා 11 ක පමණි. ඉතිරි යෝජනා 33 ක් සඳහා අදාල බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රජා සංවිධාන සමඟ සම්බන්ධ වී එම සංවිධාන සමඟ එකී යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2011 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදී ඇති වැඩ යෝජනා 33 ක් සම්බන්ධයෙන් වැඩ ආරම්භ කිරීම් ප්‍රමාද වී තබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

ආයතනයට අදාලව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය